# කාර්ය සාධන වාර්තාව

# 2011

## ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

*නො. 42,*
*ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,*
*තැ.පෙ. 537,*
*කොළඹ - 07.*

# ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

## ඉදිරි දැක්ම

*" ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ හා*
*සියළු කෘෂිකාර්මික ඉඩම්වල තිරසාර*
*සංවර්ධනය "*

## මෙහෙවර

*" ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ තිරසාර සංවර්ධනය*
*හා*
*සියළු කෘෂිකාර්මික ඉඩම්වලින්*
*ප්‍රශස්ථ ඵලදායිතාවයක් ලබා ගත හැකි වන පරිදි*
*ආයතනික, සහායක, නෛතික හා කළමනාකරණ*
*සේවාවන් සැකසීම හා කාලානුරූපව*
*පවත්වා ගෙන යාම"*

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් තුමාගෙන්.........

ලක්දිව ජනාවාස කරණය වූ දා පටන් අඛණ්ඩව පැවත එන, ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන සමස්ථ ලාංකීය ගොවි ජනතාවගේ අභිවෘද්ධිය හා රටේ සියලුම ගොවි බිම් සහ කෘෂිකර්මාන්තය සඳහා උපයෝගී කරගනු ලබන සියලු ජල මූලාශ්‍රයන්ගේ යහ කළමනාකාරීත්වය තම උදාරතර අරමුණ කොට ගනිමින් එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දුෂ්කරවුත් කටුක වුත් මාර්ගයක ප්‍රතිභා පූර්ණව ඉදිරියට ගමන් ගන්නා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි සමස්ථ කාර්යය සාධනය විදහා පාන 2011 වසරේ කාර්යය සාධන වාර්තාව මෙලෙසින් එළි දැක්වීමට හැකිවීම පිළිබඳ ව අපමණ සංතෝෂයට පත්වෙමි.

බත බුලතින් ස්වයංපෝෂිත වූ ආසියාවේ ආශ්වර්වය කරා ගමන් කිරීමේදී 2011 වසරේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරුන ඉලක්කයන් හා අභිමතාර්ථයන් නිසි ආකාරව ඉටු කිරීම සඳහා උපයෝගී කරගන්නා ලද ක්‍රමවේදයන් හා ඒ සඳහා පාදක කොටගත් සම්පත් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මෙම කාර්ය සාධන වාර්තාවේ අන්තර්ගත වේ.

2011 වසරේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරුන උත්තරීතර කාර්යය භාරය මැනවින් ඉටු කිරීම සඳහා අප වෙත නායකත්වය දුන් ගරු ගොවිජන සේවා හා වනජීවී අමාත්‍ය තුමන් ප්‍රධාන ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයටත්, හමුවන සියලු බාධක මැඩලමින් දෙපාර්තමේන්තු ඉලක්කයන් හා අභියෝග අති සාර්ථක ලෙස ජය ගැනීම සඳහා අඛණ්ඩව ඇප කැපවී ක්‍රියාකල දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන්ටත්, 2011 ක්රියාකාරී සැලැස්ම නියමාකාරයෙන් ඉෂ්ඨ සිද්ධ කරගැනීම සඳහා අප සමඟ අත්වැල් බැඳගත් සමස්ථ ශ්‍රී ලාංකීය ගොවි ජනතාවටත් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු 2011 කාර්ය සාධන වාර්තාව සමඟින් මාගේ අවංක ස්තුතිය පුද කරමි...

රවීන්ද්‍ර හේවාවිතාරණ.
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

# පටුන

**පිටු අංකය**


| | | |
|---|---|---|
| 1 . | ආයතන අංශය | 01 - 10 |
| 2. | පාලන අංශය | 11 |
| 3. | සංවර්ධන හා ප්‍රගති පාලන අංශය | 12 - 15 |
| 4 . | ප්‍රධාන ඉංජිනේරු | 16 - 17 |
| 5. | ආයතනික සංවර්ධන අංශය | 18 - 22 |
| 6. | ප්‍රවාහන අංශය | 23 |
| 7. | නීති අංශය | 24 - 26 |
| 8 . | ගිණුම් අංශය | 27 - 29 |
| 9. | අභ්‍යන්තර විගණන අංශය | 30 |
| 10. | ඵලදාවර්ධන හා අලෙවි අංශය | 31 - 32 |
| 11. | ගොවි බැංකු නියමු ව්‍යාපෘතිය | 33 - 38 |
| 12. | ජල කළමනාකරණ අංශය | 39 - 41 |
| # | ඇමුණුම් | |

# 1.ආයතන අංශය.

## 1.1 දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව

දීපව්‍යාප්ත, ඒකාබද්ධ හා දෙපාර්තමේන්තුගත තනතුරු ඇතුළුව මෙම දෙපාර්තමේන්තුවට අනුමත සේවක සංඛ්‍යාව 12004 කි. 2011 වර්ෂය අවසානය වන විට සේවයේ නිරත වූ සංඛ්‍යාව 10684 කි. පුරප්පාඩු වූ සංඛ්‍යාව 1276 කි. මීට අමතරව ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයෙන් අනුයුක්ත කර ඇති කෘෂි නිෂ්පාදන ව්‍යාපෘති සහකාර නිලධාරින් 68ක්ද සංවර්ධන සහකාර නිලධාරින් 106 ක්ද සහකාර අධ්‍යක්ෂවරුන් 25 ක්ද මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලැබේ. මෙයින් සහකාර අධ්‍යක්ෂවරුන් සඳහා අමාත්‍යාංශයෙන් වැටුප් ලැබීමේ පදනම මත මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇත. අමාත්‍යාංශය වෙතින් වැටුප් ගෙවීමේ පදනම මත මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර සිටි කෘෂිකර්ම පර්යේෂණ හා ඵලදා වර්ධන නිලධාරීන් 14 ක් ඇතුලත්ව නිලධාරීන් 25 දෙනෙකු සහකාර අධියක්ෂවරු වශයෙන් සමාලෝචන වර්ෂය තුලදී මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ කටයුතු සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් , අතිරේක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් තනතුර හා කොමසාරිස් තනතුරු 03 ක්ද නියෝජ්‍ය කොමසාරිස් තනතුරු 05 ක්ද අනුමත වී ඇත. සමාලෝචන වර්ෂය අවසානය වන විට මින් නියෝජ්‍ය කොමසාරිස් තනතුරු 05ක් පුරප්පාඩුව පැවතුණි. සහකාර කොමසාරිස් තනතුරු 36 ක් අනුමත වී ඇති අතර පුරප්පාඩු 12ක් පැවතුණි. ශ්‍රී ලං.ප.සේ නොවන නියෝජ්‍ය කොමසාරිස් (නීති) තනතුර පුරප්පාඩුව පැවතුණු අතර 28 ක් වූ අනුමත දෙපාර්තමේන්තු සහකාර කොමසාරිස් තනතුරු සංඛ්‍යාවෙන් සමාලෝචන වර්ෂය අවසානය වන විට සේවයේ නිරත වූ සංඛ්‍යාව 04 කි. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 24කි.

රාජ්‍ය කළමණාකරන සහකාර සේවයේ අධි පංතියේ පුරප්පාඩු 08 ක් වූ අතර සමාලෝචන වර්ෂය අවසානය වන විට රාජ්‍ය කළමණාකරන සහකාර සේවයේ පුරප්පාඩු වූ සංඛ්‍යාව 115ක් විය. සමාලෝචන වර්ෂය තුලදී රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයට නවක නිලධාරීන් බඳවා ගෙන මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීම නිසා පුරප්පාඩු තරමක් සම්පූර්ණ කිරිමට හැකිවිය.

## 1.2 කාර්ය මණ්ඩල සංවිධාන ව්‍යුහය.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය කාර්ය සාධන මට්ටම පවත්වා ගැනීමට වග කියන අතරම, ඒ සඳහා තමන් යටතේ සේවය කරන විවිධ මට්ටම්වල නිලධාරීන්ට වගකීම් හා බල තල පවරා ඇත.

දෙපාර්තමේන්තුවේ අරමුණු හා අභිමතාර්ථ ලඟා කර ගැනීම සඳහා සහාය ලබා දුන් සමාලෝචන වර්ෂ අවසානය වන විට සේවයේ නිරත වී සිටි දෙපාර්තමේන්තුවට අනුමත විවිධ තනතුරුවල සේවක සංඛ්‍යාව පහත පරිදි වේ.

# ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
## <u>2011-12-31 දිනට සේවක සංඛ්‍යා තොරතුරු</u>

| අංකය | තනතුර | සේවය | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් | ශ්‍රී ලං.ප.සේ. විශේෂ | 01 | 01 | - |
| 02 | අතිරේක කොමසාරිස් ජනරාල් | ශ්‍රී ලං.ප.සේ. විශේෂ | 01 | 01 | - |
| 03 | කොමසාරිස් | ශ්‍රී ලං.ප.සේ. I | 03 | 03 | - |
| 04 | නියෝජ්‍ය කොමසාරිස් | ශ්‍රී ලං.ප.සේ. II | 08 | 03 | 05 |
| 05 | සහකාර කොමසාරිස් | ශ්‍රී ලං.ප.සේ. III | 36 | 24 | 12 |
| 06 | නියෝජ්‍ය කොමසාරිස් (නීති) | ශ්‍රී ලං.ප.සේ. නොවන | 01 | - | 01 |
| 07 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේ. I | 01 | 01 | - |
| 08 | ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේ. | 06 | 06 | - |
| 09 | ඉංජිනේරු | ශ්‍රී ලං.ඉ.සේ. | 11 | 09 | 02 |
| 10 | සහකාර කොමසාරිස් | දෙපාර්තමේන්තු | 28 | 04 | 24 |
| 11 | ගොවිජන සංවර්ධන නිළධාරී | දෙපාර්තමේන්තු | 610 | 444 | 166 |
| 12 | භෂා පරිවර්තක සේවය | ඒකාබද්ධ | 02 | - | 02 |
| 13 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය (අධි) | ඒකාබද්ධ | 10 | 02 | 08 |
| 14 | ගොවි බැංකු ව්‍යාපෘති සහකාර | දෙපාර්තමේන්තු | 100 | 54 | 46 |
| 15 | නීති සහකාර | දෙපාර්තමේන්තු | 25 | 16 | 09 |
| 16 | අයවැය සහකාර | - | 01 | 01 | - |
| 17 | සැලසුම් ශිල්පී | දෙපාර්තමේන්තු | 01 | 01 | - |
| 18 | යාන්ත්‍රික වැඩ අධිකාරී | දෙපාර්තමේන්තු | 02 | 02 | - |
| 19 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | ශ්‍රී ලං.තා.සේ විශේෂ | 13 | 08 | 05 |
| | | ශ්‍රී.ලං.තා.සේ 1<br>ශ්‍රී.ලං.තා.සේ 11<br>ශ්‍රී.ලං.තා.සේ 111 | 100 | 84 | 16 |
| 20 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | ඒකාබද්ධ | 534 | 419 | 115 |
| 21 | ප්‍රචාරක නිළධාරී | දෙපාර්තමේන්තු | 01 | - | 01 |
| 22 | ලඝු/යතුරු ලේඛක* | දෙපාර්තමේන්තු | 47 | 18 | - |
| 23 | ක්ෂේත්‍ර සහකාර * | දෙපාර්තමේන්තු | 06 | 02 | - |
| 24 | ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු | දෙපාර්තමේන්තු | 540 | 453 | 87 |
| 25 | රියදුරු සේවය | ඒකාබද්ධ | 91 | 75 | 16 |
| 26 | රිය සහායක | දෙපාර්තමේන්තු | 18 | 07 | 11 |
| 27 | මුරකරු | දෙපාර්තමේන්තු | 83 | 58 | 25 |
| 28 | ඩෝසර් යන්ත්‍ර ක්‍රියාකරු | දෙපාර්තමේන්තු | 17 | 16 | 01 |
| 29 | කාර්යාල කාර්ය සහායක | ඒකාබද්ධ | 79 | 77 | 02 |
| 30 | එක්ස්කැවේටර් යන්ත්‍ර ක්‍රියාකරු | දෙපාර්තමේන්තු | 04 | - | 04 |
| 31 | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර | දෙපාර්තමේන්තු | 9600 | 7396<br>1491 | 713 |
| 32 | සංචාරක බංගලා භාරකරු | දෙපාර්තමේන්තු | 07 | 02 | 05 |
| 33 | නුපුහුණු කම්කරු* | දෙපාර්තමේන්තු | 17 | 6 | - |
| | එකතුව | | 12004 | 10684 | 1276 |

* යටපත් වී යන සේවාවකි

මීට අමතරව ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයෙන් අනුයුක්ත කර ඇති පහත තනතුරුවල නිළධාරීන්ද මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබයි

| | |
|---|---|
| සහකාර අධ්‍යක්ෂ | 25 |
| කෘෂි නිෂ්පාදන ව්‍යාපෘති සහකාර | 68 |
| සංවර්ධන සහකාර | 106 |

## 1.3 ආයතන කටයුතු

**I. 2011 වර්ෂය තුල දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන්ගේ විචල්‍යතා පහත පරිදි වේ.**
**2011 වර්ෂය තුලදී මාණඩලික ශ්‍රේණියේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් වලට අදාල තොරතුරු පහත පරිදි වේ.**

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථාන මාරුවී ගිය දිනය | ස්ථාන මාරු වී ගිය සේවා ස්ථානය |
|---|---|---|---|
| 01 | කේ.එම්.එල්.බී.කැකුලන්දර මයා | 2011.01.13 | බෞද්ධ කටයුතු අමාත්‍යාංශය |
| 02 | එස්.එම්.ජී.එන්.ධර්මසේකර මයා | 2011.03.07 | ප්‍රවාහන අමාත්‍යාංශය |
| 03 | ඩබ්.ආර්.ඒ.එන්.එස්.විජයසිංහ මයා | 2011.03.16 | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය |
| 04 | එම්.ජෙගු මහතා | 2011.05.11 | උතුරු පළාත් සභාව |
| 05 | එච්.ඒ.බී.සී.ආලෝක බණ්ඩාර මහතා | 2011.05.31 | වයඹ පළාත් සභාව |
| 06 | එම්.ඒ.එල්.එස්.එන්.කේ.මන්ත්‍රීනායක මයා | 2011.08.08 | විදේශ කටයුතු අමාත්‍යාංශය |
| 07 | ඒ.එම්.ඒ.යූ.ජී.කාරියවසම් මිය | 2011.08.11 | හබරාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 08 | එස්.ප්‍රනවනාදන් මයා | 2011.11.09 | උතුරු පළාත් සභාව |
| 09 | ඩී.එම්.එන්.දිසානායක මයා | 2011.12.26 | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය |

2011 වර්ෂය තුල ශ්‍රී ලං.ග.සේ. හා ශ්‍රී ලං.ඉ.සේ. නිලධාරීන් දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරු වීම් ලබා නොමැත.

**<u>දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වී පැමිණි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්</u>**

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථාන මාරුවී පැමිණි දිනය | ස්ථාන මාරු වී පැමිණීමට පෙර සේවය කල සේවා ස්ථානය |
|---|---|---|---|
| 01 | ඒ.එම්.ඒ.යූ.ජී.කාරියවසම් මිය ශ්‍රී.ලං.ප.සේ. III | 2011.04.21 | කඩවත්සතර ප්‍රා.ලේ.කා. |
| 02 | ජේ.එස්.අරුල්රාජ් මයා ශ්‍රී.ලං.ප.සේ. III | 2011.05.09 | උතුරු පළාත් සභාව |
| 03 | ප්‍රබුදිතා සුජීවනී බණ්ඩාර මිය ශ්‍රී.ලං.ප.සේ. III | 2011.06.14 | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 04 | එස්.එම්.එම්.විජිතා මායාදුන්න මිය ශ්‍රී.ලං.ප.සේ. III | 2011.06.21 | මුදල් කොමිෂන් සභාව |
| 05 | ආර්.පී.ජී.පොඩිනෝරිස් මයා ශ්‍රී.ලං.ප.සේ. III | 2011.07.11 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
| 06 | ඩී.එම්.ආර්.පී.දගනායක මයා ශ්‍රී.ලං.ප.සේ. III | 2011.07.13 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
| 07 | පී.ඩී.ඒ.ස්වර්ණලතා මිය ශ්‍රී.ලං.ප.සේ. III | 2011.08.17 | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| 08 | හේමන්ත ගමගේ මයා ශ්‍රී.ලං.ප.සේ. I | 2011.09.14 | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |

2011 වර්ෂය තුල ශ්‍රී ලං.ග.සේ. හා ශ්‍රී ලං.ඉ.සේ. නිලධාරීන් දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වීම් ලබා නොමැත.

<u>නව පත්වීම් ලද දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන්ගේ තොරතුරු</u>

| අනු අංකය | නිලධාරියාගේ නම | සේවය | දෙපාර්තමේන්තුවට අනුයුක්ත වූ දිනය |
|---|---|---|---|
| 01 | පි.කොඩිතුවක්කු මිය | ශ්‍රී ලං.ප.සේ. | 2011.10.25 පුහුණුවීම් සඳහා |
| 02 | ඩබ්.එච්.ඕ.ශ්‍යාමලී මිය | ශ්‍රී ලං.ප.සේ. | |

## II. නව බඳවා ගැනීම්

- **ගොවිජන සංවර්ධන නිලධාරී තනතුර**

  2009.06.13 දින පැවති විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත 2011 වර්ෂය තුල ගොවිජන සංවර්ධන නිලධාරීන් 63 දෙනෙකු බඳවා ගැනීම සඳහා 2011.11.05, 2011.12.14 සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත.

- **කම්වූ ලිපිකරු තනතුර**
  2009.08.01 දින පැවති විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත නිලධාරීන් 14 දෙනෙකු 2011.12.15 බඳවා ගන්නා ලදී.

- **නීති සහකාර සහ ගොවි බැංකු**
  සමාලෝචන වර්ෂය තුල එක් නිලධාරියකු හෝ දෙපාර්තමේන්තුවට බඳවා ගෙන නොමැත.

- **රාජ්‍ය කළමණාකරන සහකාර සේවය**
  2010 වර්ෂයේ පවත්වන ලද රාජ්‍ය කළමණාකරන සහකාර සේවයේ සීමිත සහ විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත නිලධාරින් බඳවා ගත් අතර, ඉන් 56 දෙනෙකු මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලදී.

- **කාර්යාල සේවක සේවය**
  රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් විධිමත් පත්වීම් ලිපි නිකුත් කරන තුරු කාර්යාල සේවක සේවය සඳහා සේවක මහතුන් 09 දෙනෙකු 2011.12.12 දින මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලදී.

- **කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර**
  උතුරින් අවතැන්ව පැමිණි මුස්ලිම් ජනතාව සඳහා වූ ලේකම් කාර්යාල වසා දැමීම නිසා එහි සේවය කල නිලධාරීන් 50ක් පිරිස අමාත්‍ය මණ්ඩල සංදේශ තීරණ පරිදි 2011.12.01 දින සිට කෘ.ප.නි.ස. තනතුරට අන්තර්ග්‍රහණය කර ඇත.මෙම නිලධාරීන් යාපනය,මන්නාරම,මුලතිව්,වව්නියාව, දිස්ත්‍රික්ක වලට අනුයුක්ත කරන ලදී.

## III. පත්වීම් ස්ථිර කිරීම

සමාලෝචන වර්ෂය තුල පහත තනතුරු දරන නිලධාරීන්ගේ පත්වීම ස්ථිර කරනු ලැබීය.

| <u>තනතුර</u> | <u>ස්ථිර කළ සංඛ්‍යාව</u> |
|---|---|
| • කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර | 59 |
| • කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර 11 පන්තිය | 55 |

## IV. උසස් වීම්

සමාලෝචන වර්ෂය තුල දෙපාර්තමේන්තුවේ සිටින ශ්‍රී ලං.ප.සේ. II පන්තියේ නිලධාරීන් 01 අයෙකු I පන්තියට උසස් වීම් ලබා ඇත.

## V. තනතුර අතහැර යෑම් / ඉල්ලා අස්වීම්/ මිය යෑම්

සමාලෝචන වර්ෂය තුල තනතුරු වල සිදුවූ වෙනස්වීම් පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | අත්හැර යාම් සංඛ්‍යාව | ඉල්ලා අස්වීම් සංඛ්‍යාව | මිය යෑම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | - | - |
| 02 | ගොවිජන සංවර්ධන නිලධාරී තනතුර | 03 | - | 02 |
| 03 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 01 | - | - |
| 04 | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර | 14 | 01 | 01 |
| 05 | කම්වු ලිපිකරු තනතුර | 03 | - | 03 |
| 06 | කාර්යාල කාර්ය සහායක තනතර | 01 | - | - |

## VI. ස්ථාන මාරුවීම්

දීපව්‍යාප්ත සේවාවන් හැරුණු විට ඒකාබද්ධ සේවාවල නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | ස්ථාන මාරු වී ගිය සංඛ්‍යාව | ස්ථාන මාරු වී පැමිණි සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 49 | 55 |
| 02 | රියදුරු | 01 | 05 |
| 03 | කාර්යාල කාර්ය සහායක තනතුර | 03 | 06 |

❖ රා.ප.ච.16/2010 අනුව රැකියා ලබා දිමේ පදනම මත යටතේ බඳවා ගත් උපාධිධාරීන් වෙනත් තනතුරකට මුදා හැරීම යටතේ මෙම දෙපාර්තමේන්තුවට ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් පහත පරිදි වේ.

- ගොවි බැංකු 05
- සංවර්ධන සහකාර 16
- නීති සහකාර 04

**VII. විශ්‍රාම ගැනීම**

සමාලෝචන වර්ෂය තුල රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලද නිලධාරීන්ගේ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | විශ්‍රාම ගිය සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | වි.වැ.ව්‍ය. 2.17 වගන්තියෙන් | වි.වැ.ව්‍ය. 2.12 වගන්තියෙන් |
| 01 | ගොවිජන සංවර්ධන නිලධාරී සේවය | 26 | 08 |
| 02 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 08 | - |
| 03 | තාක්ෂණ සේවය | 04 | - |
| 04 | කම්වු ලිපිකරු | 14 | 01 |
| 05 | කෘ.ප.නි.ස. | 03 | |
| 06 | රියදුරු | 01 | - |
| 07 | කාර්යාල කාර්ය සහායක තනතර | 04 | - |
| 08 | මුරකරු | 04 | - |

## 1.4 කාර්යක්ෂමතා කඩඉම්

සමාලෝචන වර්ෂය තුල කම්වු ලිපිකරු සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2011.05.23 දින පැවැත්වූ අතර ගොවිජන සංවර්ධන නිලධාරී සේවයේ කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය 2011.06.25 දින පැවැත්වූ අතර,කෘ.ප.නි.ස වරුන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය 2011.12.23 දින පැවැත්විය. එහි ප්‍රතිඵල නිකුත් කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී.

## 1.5 විදේශ සංචාර හා පුහුණු

සමාලෝචන වර්ෂය තුල විදේශ ශිෂ්‍යත්ව, සම්මේලන හා වැඩමුළු සඳහා සහභාගී වූ නිලධාරීන් පහත පරිදි වේ.

- 2011.01.16 දින සිට 2011.01.25 දින දක්වා සිවිල් ඉංජිනේරු දීප්ත ප්‍රභාත් විතාරණ මහතා ඉන්දියාවේ හයිද්‍රාබාත් නුවර පැවති අන්තර්ජාතික වැඩමුලුවට සහභාගි විය.

- 2011.04.18 දින සිට 2011.04.22 දින දක්වා කෘෂි නිෂ්පාදන ව්‍යාපෘති සහකාර කේ.ඊ.එම්.ඊ.කහංගම මහත්මිය ඉන්දියාවේ බැංගලෝර්හි පැවති RVAFFSIF .IMORATIO.PROJECT REGION SYSTEMATIZATION WORKSHOP, BANGALORE, INDIA වැඩ සටහනට සහභාගී විය.

- 2011.09.11 දින සිට 2011.09.21 දින දක්වා යාන්ත්‍රික අධිකාරි මහේෂ් ගුණසේකර මහතා, යාන්ත්‍රික වැඩ අධිකාරී ආනන්ද වීරවංශ මහතා හා ඉංජිනේරු සහකාර ගුණතිලක වික්‍රමසිංහ මහතා මහජන චීන සමූහාණ්ඩුවේ බීජිං නුවර පැවති යන්ත්‍රෝපකරණ පුහුණු පාඨමාලාවට සහභාගි වූහ.

## 1.6 විනය කටයුතු

සමාලෝචන වර්ෂය තුල දෙපාර්තමේන්තුව වෙත විධිමත් විනය පරීක්ෂණ කටයුතුවලට අදාලව පැමිණිලි 66 ක් ලැබී ඇත. සමාලෝචන වර්ෂය තුල දී විනය හේතු මත වැඩ තහනම් කර ඇති සංඛ්‍යාව 11 කි. නැවත සේවයේ පිහිටවූ සංඛ්‍යාව 08 කි.

## 1.7 පුහුණු හා හැකියා වර්ධන

සමාලෝචන වර්ෂය තුල දී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කුසලතා, ආකල්ප හා දැනුම වර්ධනය කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ. මේ සඳහා රුපියල් ලක්ෂ 25 ක ප්‍රතිපාදන වෙන් වී තිබූ අතර වර්ෂ අවසානය වන විට රුපියල් 24,85744.76 ක් වැය කර තිබුණි.

| පුහුණුව ලබා දුන් තනතුර | පුහුණු වැඩසටහන පිළිබඳ විස්තරය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | සිගාස් පුහුණුව | 150 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | වැටුප් පරිවර්තන පුහුණුව | 50 |
| ගොවිජන සංවර්ධන නිලධාරී හා ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු කුරුණෑගල දිස්ත්‍රික්කය | මධ්‍යස්ථාන ගිණුම් කටයුතු පුහුණුව 1 කණ්ඩායම | 60 |
| ගොවිජන සංවර්ධන නිලධාරී හා ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු කුරුණෑගල දිස්ත්‍රික්කය | මධ්‍යස්ථාන ගිණුම් කටයුතු පුහුණුව 11 කණ්ඩායම | 75 |
| ගොවිජන සංවර්ධන නිලධාරී හා ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු කෑගල්ල දිස්ත්‍රික්කය | මධ්‍යස්ථාන ගිණුම් කටයුතු පුහුණුව | 40 |
| ගොවිජන සංවර්ධන නිලධාරී හා ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු ගාල්ල දිස්ත්‍රික්කය | මධ්‍යස්ථාන ගිණුම් කටයුතු පුහුණුව | 60 |
| ගොවිජන සංවර්ධන නිලධාරී හා ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු රත්නපුර දිස්ත්‍රික්කය | මධ්‍යස්ථාන ගිණුම් කටයුතු පුහුණුව | 50 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නවක නිලධාරීන් - ප්‍රධාන කාර්යාලය | සේවාරම්භක පුහුණුව | 45 |
| මනෝහාරි ජයතුංග මෙය ස.කො.(මු/වැ.හා.ගෙ) | ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | 01 |
| ටී.ඩබ්.ඒ.නාරායන මෙය | දෙමළ භාෂා පාඨමාලාව | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | සහභාගීත්ව දිමනා | 10 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් - ගම්පහ | CIGAS AND PAYROLL | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | ආයතන කටයුතු පුහුණුව | 50 |
| විගණන අංශයට අනුයුක්ත උපාධිධාරීන් | විනය පුහුණුව | 60 |
| ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාල වල මාණ්ඩලික නිලධාරීන් | වත්කම් කළමනාකරණය පිළිබඳ මෘදුකාංග පාඨමාලාව | 85 |
| කාර්මික නිලධාරීන් | සිවිල් ඉංජිනේරුමය පස් පරීක්ෂණ පුහුණුව | 25 |

| | | |
|---|---|---|
| බී.වී.එස්.කේ.බෝපිටිය මහතා ගොවිජන සංවර්ධන නිලධාරී | Geoinformatics Training | 01 |
| යූ.පී.ඩී.එල්.මල්වත්ත මෙය එම්.පි.කේ.ජයතුංග මෙය | Payroll System | 02 |
| බදුල්ල දිස්ත්‍රික් කාර්ය මණ්ඩලය | ඵලදායිතා පුහුණුව | |
| ගොවිජන සංවර්ධන නිලධාරී - කුරුණෑගල | ආයතන කටයුතු පුහුණුව | 50 |
| ගොවිජන සංවර්ධන නිලධාරී හා ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු(ගම්පහ) | මධ්‍යස්ථාන ගිණුම් කටයුතු පුහුණුව | 50 |
| විගණන අංශයට අනුයුක්ත උපාධිධාරීන් | ගිණුම් පුහුණුව | 50 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | ගිණුම් පියවීමේ වැඩමුවව | 100 |
| ඉංජිනේරු එම්.එම්.මූනාස් මහතා | පශ්චාත් උපාධි පාඨමාලාව | 01 |
| කෘ.ප.නි.ස. - පුත්තලම දිස්ත්‍රික්කය | ඵලදායිතා පුහුණුව - වැඩමුළු 03 | 313 |
| ගොවිජන සංවර්ධන නිලධාරීන් හා කෘ.ප.නි.ස. නිලධාරීන් | ගොවි බැංකු පුහුණුව | 55 |

## 1.8 සාකච්ඡා

සමාලෝචන වර්ෂය තුල දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්, දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස් වරුන්, ඉංජිනේරුවන් හා දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡා 08 ක් හා වෙනත් සකාච්ඡා 02 ක් සමග සාකච්ඡා 10 ක් පැවැත්වීය ඒ සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.

| සාකච්ඡාව පැවැත්වූ දිනය | ස්ථානය |
|---|---|
| 2011.01.24 හා 25 දෙදින | ත්‍රිකුණාමලය සර්වෝදය දිස්ත්‍රික් මධ්‍යස්ථානය |
| 2011.05.09 , 10 දෙදින | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පුහුණු මධ්‍යස්ථානය |
| 2011.05.21 | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය |
| 2011.08.11 හා 12 දෙදින | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පුහුණු මධ්‍යස්ථානය |
| 2011.08.29, 30 දෙදින | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පුහුණු මධ්‍යස්ථානය |
| 2011.09.16 දින | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය |
| 2011.09.30 දින | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය |
| 2011.11.04 , 05 දෙදින | පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය |
| 2011.12.19 ,20 දෙදින | පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය |
| අනෙකුත් සාකච්ඡා | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය |
| | |

## 1.9 සමාලෝචන වර්ෂය තුල දෙපාර්තමේන්තුවේ අරමුණු අභිමතාර්ථ ලඟා කර ගැනීම උදෙසා තම දායකත්වය ලබා දුන් දීප ව්‍යාප්ත සේවාවන්වල නිලධාරීන් පහත දක්වා ඇත.

### 1.9.1 ප්‍රධාන කාර්යාලයේ ශ්‍රී ලං.ප.සේ. නිලධාරීන්

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | රවීන්ද්‍ර හේවාවිතාරණ මහතා | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් |
| 02 | සුමිත්‍රා කන්නන්ගර මිය | අතිරේක කොමසාරිස් ජනරාල් |
| 03 | චන්දන කුමාරසිංහ | කොමසාරිස් (මා.ස.සං) |
| 04 | ඩබ්.ඒ.ඩී. කරුණාතිලක මහතා | කොමසාරිස් (සේවා) |
| 05 | හේමන්ත ගමගේ මහතා | කොමසාරිස් (සංවර්ධන) |
| 06 | පුෂ්පකුමාර මහතා | සහකාර කොමසාරිස් (පාලන) |
| 06 | විජිතා මායාදුන්න මිය | නියෝජ්‍ය කොමසාරිස් (සේවා) වැ.බ |
| 07 | කේ.ඒ.එස්.සමරජීව මිය | සහකාර කොමසාරිස් (ආයතන) |

### 1.9.2 දිස්ත්‍රික් කාර්යාලවල ශ්‍රී ලං.ප.සේ නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | එන්.පී.අමරතුංග මහතා | සහකාර කොමසාරිස් - කොළඹ |
| 02 | පුබුදිතා සුජීවනී බණ්ඩාර මිය | සහකාර කොමසාරිස් - ගම්පහ |
| 03 | ඒ.එම්.ආරිෆ් මහතා | සහකාර කොමසාරිස් - කළුතර |
| 04 | අයි.කේ.ජී.මුතුබණ්ඩා මහතා | නියෝජ්‍ය කොමසාරිස් - මහනුවර |
| 05 | පී.ජී.සෝමරත්න මහතා | සහකාර කොමසාරිස් - මාතලේ |
| 06 | ඩී.එම්.ආර්.පී.දසනායක මහතා | සහකාර කොමසාරිස් - නුවරඑළිය |
| 07 | ඩී.එල්.කේ.ප්‍රියවංශ මහතා | සහකාර කොමසාරිස් - හම්බන්තොට |
| 08 | පි.කොඩිතුවක්කු මිය | සහකාර කොමසාරිස් - ගාල්ල |
| 09 | ඩබ්.එච්.ඩී.ශ්‍යාමලී මිය | සහකාර කොමසාරිස් - මාතර |
| 10 | එම්.පී.ඩිරන්ජන් මහතා | සහකාර කොමසාරිස් - යාපනය |
| 11 | එන්.සිවලිංගම් මහතා | සහකාර කොමසාරිස් - මන්නාරම |
| 12 | ජේ.එස්.අරුල්රාජ් මහතා | සහකාර කොමසාරිස් - වව්නියාව |
| 13 | ඊ.තයාරූබන් මහතා | සහකාර කොමසාරිස් - කිලිනොච්චිය |
| 14 | ආර්.රුෂාන්දන් මහතා | සහකාර කොමසාරිස් - මඩකළපුව |
| 15 | එස්.පුනිතකුමාර් මහතා | සහකාර කොමසාරිස් - ත්‍රිකුණාමළය |
| 16 | ජී.ඩී.ඒ.ස්වර්ණලතා මිය | නියෝජ්‍ය කොමසාරිස් - කුරුණෑගල |
| 17 | ඩී.එම්.ජී.බී.දිසානායක මහතා | සහකාර කොමසාරිස් - කුරුණෑගල |
| 18 | ආර්.පී.ජී.පොඩිනෝරිස් මහතා | සහකාර කොමසාරිස් - පුත්තලම |
| 19 | ආර්.එම්.කේ.ආර්.බි.රත්නායක මහතා | සහකාර කොමසාරිස් - අනුරාධපුර |
| 20 | එම්.යූ.නිශාන්ත මහතා | සහකාර කොමසාරිස් - පොළොන්නරුව |
| 21 | එස්.එම්.ඩී.සී.සමරසේකර මහතා | සහකාර කොමසාරිස් - බදුල්ල |
| 22 | එම්.එස්.ඒ.සේනාරත්න මිය | සහකාර කොමසාරිස් - රත්නපුර |
| 23 | ඉසඩ්.ඒ.එම්.ෆයිසාල් මහතා | සහකාර කොමසාරිස් - කෑගල්ල |

### 1.9.3 දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලං.ග.සේ නිලධාරීන්

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | එස්. කොඩිතුවක්කු මහතා | කොමසාරිස් (මුදල්) |
| 02 | ඩබ්.එම්.එම්.බී.එච්. ගුණරත්න මහතා | නියෝජ්‍ය කොමසාරිස් (මුදල්) |
| 03 | රේණුකා කොළඹගේ මිය | නියෝජ්‍ය කොමසාරිස් (මුදල්) |
| 04 | ඩී.පි.එස්. ප්‍රනාන්දු මිය | සහකාර කොමසාරිස් (මුදල්) |
| 05 | එම්.ඒ.අයි.එස්. මහානාම මිය | සහකාර කොමසාරිස් (මුදල්) |
| 06 | එම්.පී.කේ. ජයතුංග මෙය | සහකාර කොමසාරිස් (මුදල්) |
| 07 | ටී.ඒ.ඩබ්. නාරායන මෙය | සහකාර කොමසාරිස් (මුදල්) |
| 08 | එස්.පී. ගාමිණී මහතා | සහකාර කොමසාරිස් (මුදල්) |

### 1.9.4 දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලං.ඉ.සේ නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | ටී.එස්.විජේවර්ධන මහතා | ප්‍රධාන ඉංජිනේරු |
| 02 | ඩී.ඩී.ප්‍රභාත් විතාරණ මහතා | ඉංජිනේරු - ජළ කළමනාකරණ |
| 03 | ආර්.එම්.යූ.රත්නායක මහතා | ප්‍රාදේශීය ඉංජිනේරු - කුරුණෑගල |
| 04 | කේ.එම්.බී.කැඳරගම මහතා | ප්‍රාදේශීය ඉංජිනේරු -මහනුවර |
| 05 | ඒ.එල්.එම්.මහීර් මහතා | ප්‍රාදේශීය ඉංජිනේරු - අනුරාධපුර |
| 06 | වසන්ත අමරආරච්චි මහතා | ප්‍රාදේශීය ඉංජිනේරු - වව්නියාව |
| 07 | එච්.ජී.කේ.ප්‍රියශාන්ත මහතා | ප්‍රාදේශීය ඉංජිනේරු - හම්බන්තොට |
| 08 | එම්.එම්.මුනාස් මහතා | ප්‍රාදේශීය ඉංජිනේරු - අම්පාර |
| 09 | ඊ.එම්.ආර්.එස්.සෙනෙවිරත්න මිය | ප්‍රාදේශීය ඉංජිනේරු - රත්නපුර |

### 1.9.5 දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්වරුන් පිළිබඳ විස්තර

| අනු අංකය | නම | සේවා සථානය |
|---|---|---|
| 01 | ඩබ්.ඒ.අයි.පෙරේරා මහත්මිය | කුරුණෑගල |
| 02 | ඩබ්.එම්.එම්.බී.පහළගිරිබාව මහතා | අනුරාධපුර |
| 03 | එස්.ඒ.ඩබ්.සමරසිංහ මහතා | පොළොන්නරුව |

# 2. පාලන අංශය.

පාලන අංශය මගින් ඉටු කරනු ලබන ප්‍රධානම සේවාව වනුයේ දෙපාර්තමේන්තුවට ලැබෙන සියලුම සාමාන්‍ය ලිපි , ලියාපදිංචි ලිපි හා චෙක්පත් ඒ ඒ අංශ වෙත යොමු කිරීම සහ ඒ ඒ අංශ වලින් ලැබෙන සියලුම ලිපි අදාල ආයතන හා පුද්ගලයින් වෙත යැවීමට කටයුතු කිරීමයි.

ඊට අමතරව පහත සඳහන් සේවාවන්ද පාලන අංශය මගින් ඉටුකරනු ලබයි.

- දෙපාර්තමේන්තුවේ ආරක්ෂක හා පවිත්‍රතා කටයුතු පවත්වාගෙන යෑම.
- දෙපාර්තමේන්තුවේ සියලුම දුරකථන බිල්පත් , විදුලි බිල්පත්, ජල බිල්පත් පියවීම හා වරිපනම් ගාස්තු ගෙවීම.
- දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ සියලුම නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධ රාජකාරී.
- ගොවිජන සේවා හා වනජීවී කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට අදාල ලිපි සම්බන්ධීකරණය කිරීම.
- දෙපාර්තමේන්තු අභ්‍යන්තර දුරකතන පද්ධතියේ නඩත්තු කටයුතු සිදු කිරීම.
- නිල නිවාස කුලී අය කිරීම.
- නිලධාරීන්ගේ ඇප තැන්පත් මුදල් ආපසු ගෙවීම.
- දෙපාර්තමේන්තුව වෙත මිල දී ගනු ලබන පුවත්පත් සම්බන්ධ සියලුම රාජකාරි.
- දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් සඳහා දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ලබාදීම.
- දුම්රිය බලපත්‍ර ලබා දීම.
- පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න හා සම්බන්ධ ලිපි සම්බන්ධීකරණය කිරීම.
- මහජන පෙත්සම් කාරක සභාව හා සම්බන්ධ ලිපි සම්බන්ධීකරණය කිරීම.
- පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අදාල ලිපි පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු.

මීට අමතරව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් තුමාගේ උපදෙස් පරිදි 2011 වර්ෂයේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු පරිශ්‍රයේ එලවළු වගා කිරීමේ කටයුතුද පාලන අංශය මඟින් සිදුකරන ලදී.

# 3.සංවර්ධන හා ප්‍රගති පාලන අංශය.

## 3.1 ගොඩනැගිලි ඉදිකිරීම හා පුනරුත්ථාපනය (ගොවිජන සේවා මධ්‍යස්ථාන)

ගොවිජන සේවා මධ්‍යස්ථාන පුනරුත්තාපනය සඳහා රු.මිලි. 70 ක් වෙන් කර තිබූ අතර යාපනය, මහනුවර, කොළඹ, මඩකලපුව, මාතලේ, ත්‍රිකුණාමලය, මාතර, ගම්පහ, කළුතර, ගාල්ල, නුවරඑළිය, කුරුණෑගල, අම්පාර, වවුනියා, අනුරාධපුරය, කෑගල්ල, රත්නපුර, ගාල්ල, හම්බන්තොට, පොළොන්නරුව, පුත්තලම දිස්ත්‍රික්ක වලට අදාල මධ්‍යස්ථාන 57 ක අලුත්වැඩියා කටයුතු ඉටුකර ඇත. මධ්‍යස්ථාන 440 ක් වර්ණාලේප කර ඇත.

## 3.2 ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල වල අලුත්වැඩියාවන්

මේ වැය ශීර්ෂය යටතේ වෙන්ව තිබූ මිලියන රු.මි.18ක මුදලින් ප්‍රධාන කාර්යාලයේ අලුත්වැඩියා කටයුතු, නාරාහේන්පිට ගබඩා සංකීර්ණය, මාලඹේ යන්ත්‍රාගාරය අලුත්වැඩියා කිරීම හා ගම්පහ, කෑගල්ල, කුරුණෑගල, කොළඹ, මඩකලපුව, යාපනය, අනුරාධපුරය, මාතලේ, ත්‍රිකුණාමලය, හම්බන්තොට, අම්පාර, පුත්තලම, කළුතර, මහනුවර, බදුල්ල, වවුනියාව, දිස්ත්‍රික් කාර්යාල වල අලුත්වැඩියාවන් සිදු කර ඇත.

## 3.3 ගොවිජන සේවා මධ්‍යස්ථාන නව ඉදිකිරීම්

මේ සඳහා රු.මි. 20 වෙන්කර තිබූ අතර මාතර දිස්ත්‍රික්කයේ සුනාමියෙන් හානියට පත් තලල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. රත්නපුර දිස්ත්‍රික්කයේ කල්තොට ගො.සේ.ම ඉදිකිරීම හා බදුල්ල දිස්ත්‍රික්කයේ රඹුක්පොත ගො.සේ.ම ඉදිකිරීම සිදු කර ඇත.

ප්‍රධාන කාර්යාලය හා බදුල්ල, කොළඹ දිස්ත්‍රික්කයන්හි ගො.සේ. මධ්‍යස්ථානවල සුළු ඉදිකිරීම් කටයුතු කර ඇත.

## 3.4 සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය

මෙම දෙපාර්තමේන්තුව ආරම්භයේදී සිටම සුලු වාරිමාර්ග පුනරුත්තාපනය මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් විය. 2000 ග්‍රාමීය වාරිමාර්ග සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාව පුරා වැව් 11257 ක්ද අමුණු 12942 ක්ද ඇත. මෙයට සම්බන්ධ වාරිමාර්ග ප්‍රමාණය අති විශාලය. වී වගා කරන ගොවීන් වෙනුවෙන් මේවා නඩත්තු කිරීම හා ප්‍රතිසංස්කරණය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පසුගිය වර්ෂ 50ක කාලය තුල ඉටුකරන ලදි.

## 3.5 බාහිර ආයතන සමඟ කටයුතු

ජාතික සවිය ගමනැගුම යටතේ ප්‍රාදේශීය ලේකම් හරහා ලැබුනු ප්‍රතිපාදන මි. 411 කි. ඒ යටතේ දිස්ත්‍රික් 11 ක සුළු වාරිමාර්ග අලුත්වැඩියාවන් 703 ක් කර්මාන්ත වශයෙන් සිදු කර ඇත.

## 3.6 පුරන් කුඹුරු අස්වැද්දීම

පුරන් කුඹුරු අස්වැද්දීම යටතේ සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම රු. මි. 220 කි. දිස්ත්‍රික් 25 ම ආවරණය වන පරිදි සිදු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 335 කි. නැවත වගා කෙරුන අක්කර ප්‍රමාණය 13087.75කි. ප්‍රතිලාභී ගොවි පවුල් ගණන 12789 කි.

NECORD, World Food Programme, Peace wind Japan, USAD, UNDP, World Vision ආදී සංවිධාන යටතේ ත්‍රිකුණාමලය සහ කිළිනොච්චි දිස්ත්‍රික්ක වලට රු.මි. 153 ක ප්‍රතිපාදන, කර්මාන්ත 48 සඳහා වෙන් කර ඇත.

යළි පුබුදමු ව්‍යාපෘතිය යටතේ ත්‍රිකුණාමලය හා මඩකලපුව සඳහා රු.මි. 118 ක් කර්මාන්ත 26 සඳහා වෙන් කර ඇත.

ගොවීන්ගේ භාරකාර අරමුදල යටතේ දිස්ත්‍රික්ක 12 ක පොහොර ගබඩා ඉදිකිරීම, මධ්‍යස්ථාන අලුත්වැඩියා, වැව් අමුණු ප්‍රතිසංස්කරණය ආදී කර්මාන්ත සඳහා රු.මි. 181.5 ක් ගිවිසුම් ගතව ඇත.

ගොවිජන සංවර්ධන අරමුදල යටතේ දිස්ත්‍රික්ක 07ක මධ්‍යස්ථානවල අලුත්වැඩියා සඳහා රු.මි. 1.4 ගිවිසුම්ගතව ඇත.

## 3.7 අලුත් සහල් මංගල්‍යය ( 2011 අප්‍රේල් 02 – 03).

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වාර්ෂිකව පවත්වා ගෙන එන අලුත් සහල් මංගල්‍යය 44 වන වරටත් අනුරාධපුර විජය ශ්‍රී ජය ශ්‍රී මහ බෝධිය ඉදිරිපිට 2011 අප්‍රේල් 02 හා 03 දිනයන්හී පවත්වන ලදි.

මහා ගංවතුරකට පසු එළැඹෙන 44 වන අලුත් සහල් මංගල්‍ය අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට ලැබීම මහත් ආශ්වාදයකි. අතිගරු ජනපතිතුමන් දිගුකාලීන යුද්ධය අවසන් කිරීමෙන් පසු පිබිදුණු දේශයේ ජනතා අපේක්ෂාවන් දින දින ලියලමින් තිබේ. පශ්චාත් නන්දිකඩාල් අභිමානය ජනතා බලාපොරොත්තු සංවර්ධනයට යොමු කිරීමට මහින්ද චින්තනය ගත් වෙහෙස මල් එල දරයි. සමස්ථ දේශයේ කෘෂිකාර්මික සංවර්ධනය නොසිතූ පරිදි පුළුල් පරාසයකට විහිදෙද්දී ඊට එල්ලවන බාධාවන්ද නැතුවා නොවෙයි. දේශයට නිතර ඇද හැළුණු මහ වැසි ගම් බිම් යට කළා පමණක් නොව ගොවි ජනයා අතර භාවයට පත් කළහ. පසුගිය කාලයේදී නැගෙනහිර හා උතුරු මැද පළාතේ කෙත් වතු හරහා පැමිණි මහා ගංවතුර සති කිහිපයක්ම සියල්ල නිශ්ක්‍රීය කළේය. එය දේශීය සහල් අස්වැන්නට මහත් සේ බලපැවේය. එබඳු අවකාශයක අලුත් සහල් මංගල්‍යයක් පවත්වන්නේ කෙසේද යන්න උභතොකොටිකයකට අපි මුහුණ දුන්නෙමු. මිහිමඩල නිවා සනහන පහන් ප්‍රාර්ථනාව තේමා ගතවූයේ ඒ අයුරිනි.

දැවෙන මිහිමඩලේ කාලගුණික හා දේශගුණික වෙනස්කම් ගොවි ජනතාවටද, මහ පොළොවටද, දරාගත නොහැකි විය. ඒ නිසා මිනිස් වර්ගයා වෙත මිහිමඩල සුවපත් කරන දියුණුවේ ගමනකට ඇරයුම් කරනු පිණිස මෙවර අලුත් සහල් මංගල්‍ය අවස්ථාවක් කොට ගැනීමට අපි තීරණය කළෙමු. මෙම සියළු කටයුතු වලදී ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගේ හා අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් පරිදි

ගොවිජන සේවාවන්හි නවමු අපේක්ෂාවන් මල්ඵල ගැන්වීමටද අලුත් සහල් මංගල්‍ය හේතු විය.

හතර වාහල් කඩ කිරි ඉතිරවීමේ සිට අලුත් සහල් පෙරහැර ශ්‍රී මහ බෝධීන් වහන්සේ අභියසට පැමිණ පූජා කිරීම දක්වා කටයුතු සජීවීව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මගින් හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් ප්‍රචාරය කිරීම ප්‍රථම වරට මෙම උත්සවයේදී ආරම්භ විය. රූපවාහිනී ප්‍රචාරය සඳහා ලංකා බැංකුව වියදම දරන ලදි.

මෙවර අලුත් සහල් මංගල්‍යයේදීද මී පැණි පූජාව හා ගිතෙල් පූජාව පවත්වන ලදි. ආදිවාසී නායක ඌරුවරිගේ වන්නියලා ඇත්තෝ ප්‍රමුඛ ආදිවාසී කණ්ඩායම මී පැණි පූජාව පවත්වන ලද අතර රත්නපුර මහ සමන් දේවාලයේ බස්නායක නිලමේ විසින් ගිතෙල් සැපයීම කරන ලදි. ගොවිජන සේවා හා වනජීවී අමාත්‍ය ගරු එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා ඇතුළු මැති ඇමතිවරුන්ද රාජ්‍ය නිලධාරීන්ද මෙම උත්සවයට සහභාගී වූහ.

දිවයිනේ සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් එක්රැස් කර බාරදුන් සහල් මෙදින පූජා කරණ ලදි. සහල් හා  මුදල් ආධාර සැපයීම දිවයින පුරා පිහිටි  ගොවි සංවිධාන විසින් කරන ලදි.

මෙම අලුත් සහල් මංගල්‍ය සාර්ථක කරගැනීමට ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය යටතේ ඇති සියළු රාජ්‍ය ආයතනයන්ද විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, අධිකාරි, මණ්ඩල, උතුරු මැද පළාත් සභාව හා පෞද්ගලික ආයතනත් විශාල දායකත්වයක් ලබා දෙන ලදි. මෙහිදී මිහිමඩල නිවා සනහන පහන් ප්‍රාර්ථනාව නමින් සමරු කලාපයක්ද එළිදක්වන ලදි.

## 3.8.1 යාන්ත්‍රික අංශය

### (දෙපාර්තමේන්තුව සතු ඩෝසර් / එක්ස්කැවේටර් යන්ත්‍ර)

සංවර්ධන හා ප්‍රගති පාලන අංශය සම්බන්ධව කටයුතු කරන යාන්ත්‍රික අංශය යාන්ත්‍රික අධිකාරිවරයෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

දැනට අප දෙපාර්තමේන්තුව සතු යන්ත්‍ර 20 ක් පහත දැක්වෙන වර්ෂ වලදී ''ජපන් යෙන්'' ප්‍රදානය යටතේ ලැබී ඇත. තවද, 2009 , 2011 වර්ෂවලදී භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් මිනි එක්ස්කැවේටර් /පොන්ටූන් යන්ත්‍ර දෙකක් ද ලබාගෙන ඇත.

| වර්ෂය - | 1983 | 1984 | 1985 | 1986 | 1990 | 1994 | 1997 | 1999 | 2009 | 2011 | - එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| යන්ත්‍ර සංඛ්‍යාව- | 01 | 01 | 06 | 02 | 02 | 05 | 01 | 02 | 01 | 01 | - 22 |

(  මීට අමතරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් චීන යන්ත්‍රෝපකරණ 36 ක් ද 2011 වර්ෂය අවසානයේදී ලැබී ඇත.එම යන්ත්ර  2012 වර්ෂයේදී සේවයට එක් කරනු ලැබේ.)

දැනට එක් ඩෝසර් යන්ත්‍රයක් ද, ට්‍රැක් ෂවල් යන්ත්‍රයක්ද අබලන් තත්වය මත සේවයෙන් ඉවත් කර අපහරණය කිරීමට කටයුතු කර ඇති අතර දැනට ඉතිරිව ඇති යන්ත්‍ර 20 පහත පරිදි වේ.

1. ඩෝසර් යන්ත්‍ර - **14**
2. එක්ස්කැවේටර් යන්ත්‍ර - **04**
3. මිනි එක්ස්කැවේටර් /පොන්ටූන් යන්ත්‍ර - **02**

**20**

2009, 2011 වර්ෂවලදී මිලට ගෙන ඇති පොන්ටූන් යන්ත්‍ර හැර අනිකුත් යන්ත්‍ර සියල්ලක්ම පාහේ දැනටමත් සේවා පැය 10,000 සීමාව පසු කර ඇති අතර, භාවිතා කළ වර්ෂ ගණනාව අනුවද **යන්ත්‍ර වල සම්පූර්ණ ආයු කාලය** ඉකුත්වී ඇති බව ඉහත අනුව පැහැදිලි වනු ඇත.

එනමුත් ඉතා දැඩි කැපවීමකින් යුතුව, මනා පරිශ්‍රමයකින් හා පාලනයකින් යුතුව නඩත්තු කර ඇති බැවින් මේවායින් **වැඩි ප්‍රමාණයක් තවමත් හොඳම යාන්ත්‍රික තත්වයෙන්** යුතුව තවදුරටත් නඩත්තු කරගෙන යාමට හැකිවී ඇත. යන්ත්‍ර නඩත්තුව සඳහා 2011 වර්ෂයට වෙන් කර තිබූ ප්‍රතිපාදනය **රු.මිලි 12** කි. **(මෙවැනි යන්ත්‍රයක නව වටිනාකම රු.මිලියන 12-15 අතර ප්‍රමාණයක් වේ.)**

**2011 දී දෙපාර්තමේන්තු ඩෝසර් / එක්ස්කැවේටර් යන්ත්‍ර.**
**ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක.**

| | දිස්ත්‍රික්කය | | යන්ත්‍ර ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | හම්බන්තොට | - | **07** |
| 2. | මොණරාගල | - | **04** |
| 3. | කුරුණෑගල | - | **04** |
| 4. | අනුරාධපුරය | - | **02** |
| 5. | කෑගල්ල | - | **01** |
| 6. | කොළඹ | - | **02** |
| | | | **20** |

එම යන්ත්‍රෝපකරණ ඉතා සහනදායී මිලකට ගොවි ජනතාව වෙත ලබාදීමට කටයුතු කරන අතර එම මිල යන්ත්‍ර සේවා පැයකට රු. 500/= සිට රු.750/= ක් පමණ වේ. (සාමාන්‍යයෙන් මෙවැනි යන්ත්‍රයක් සේවා පැයකට අය කරනු ලබන වෙළඳ පොල වටිනාකම **රු. 3000/= සිට රු. 3250/=** දක්වා වේ.) එලෙස ගොවි ජනතාව වෙත සේවා සිදු නොකරන විටකදී වෙනත් රජයේ කෘෂි/වාරිමාර්ග සංවර්ධන වැඩ සටහන් වලට ද යොදවනු ලබන අතර එවිටද රජයේ ගාස්තුවක් ලෙස අයකරණු ලබන්නේද රු.750/= (උපරිමය) ගාස්තුවක් වේ.

ඉතා දුර බැහැර අති දුෂ්කර තත්වයන් යටතේ හා වෙනත් යන්ත්‍රෝපකරණ නොමැති තත්වයන් යටතේ සේවා අවශ්‍යතාවය මත ගොවි ජනතාව වෙත උපරිම අයුරකින් සේවයේ යොදවනු ලබන මෙම යන්ත්‍ර මගින් 2011 වර්ෂයේදී රජයට ලබාදී ඇති සහනදායී පදනම යටතේ උපායාගත් ආදායම **රු.1,853,508.15** කි. නොයෙක් මූල්‍ය හේතූන් හා ප්‍රතිපාදන ලැබී තිබුණත් මුදල් ලැබීමට සිදුවූ ප්‍රමාදයන් නිසා අදාල දිස්ත්‍රික්ක වලින් තවදුරටත් ආදායම ලැබීමටත් ඇති බව පෙනී යයි.

එනම් ආසන්න වශයෙන් ඉහත කී දැනට ලැබී ඇති ආදායමට අනුව යන්ත්‍ර වල සේවා පැය 5325 ක් ක්‍රියාකාර ඇතැයි උපකල්පනය කලහොත් යන්ත්‍ර ක්‍රියාකරවීමෙන් රටට අත් කර දී ඇති සංවර්ධන වැඩවල වටිනාකම රු.3250.00 X 5325 = **රු.17,306,250.00** ක් පමණ වනු ඇත. එනම් රු. මිලියන 17 කට අධික මුදලකි.

# 4. ප්‍රධාන ඉංජිනේරු අංශය.

## 4.1 කාර්යය

1. දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන සුළු වාරිමාර්ග, ගොවිජන සේවා මධ්‍යස්ථාන, ගොඩනැගිලි, දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීම් හා අළුත් වැඩියාවන් පිළිබඳ ඇස්තමේන්තු අනුමත කිරීම, ටෙන්ඩර් මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා තාක්ෂණ වාර්තා සකස් කිරීම සහ ටෙන්ඩර් ඇගයීම් කටයුතු සිදුකිරීම.
2. මහවැලි අධිකාරිය යටතේ උණ වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
3. බාහිර රාජ්‍ය ආයතනවලින් ඉදිරිපත් කරන පාරිසරික තාක්ෂණ ඇගයීම් පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණය හා අදාල වාර්තා සැපයීම.
4. පොහොර ගබඩා ඉදිකිරීම -

   2011 වර්ෂය සඳහා පොහොර ගබඩා ඉදිකිරීමට රු. මිලියන 62.8 ක් වෙන් කෙරිණි. එමගින් නව පොහොර ගබඩා 32 ක් ඉදිකිරීමට සැලසුම්කර ඉදිකිරීම් ආරම්භ කරන ලදී. වර්ෂය තුල දී නව කර්මාන්ත 29 ක හා 2010 අවිච්ඡේදවූ කර්මාන්ත 04 ක වැඩ අවසන් කරන ලදී.

## 4.2 පොහොර ගබඩා ඉදිකිරීම 2011 නව කර්මාන්ත

**වැය ශීර්ෂය - 281/2/2/8/2104 2011/12/31 දිනට ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | | | කර්මාන්තයේ නම | ගෙවීම් | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 1 | කුරුණෑගල | 1 | නාරම්මල | 813,061.00 | 100% |
| | | 2 | ඇහැටුවැව | 1,603,783.25 | 100% |
| | | 3 | අවුලේගම | 1,247,564.30 | 100% |
| | | 4 | වෙල්පල්ල | 947,414.37 | 100% |
| | | | පරිපාලන වියදම් ගෙවීම් | 122,024.89 | |
| 2 | බදුල්ල | 5 | දඹවින්න | 2,176,515.60 | 100% |
| | | 6 | හල්දුම්මුල්ල | 1,714,417.60 | 100% |
| | | | පරිපාලන වියදම් ගෙවීම් | 42,801.00 | |
| 3 | හම්බන්තොට | 7 | නෙටොල්පිටිය | 1,894,673.53 | 100% |
| | | 8 | ලුනම | 1,840,211.07 | 100% |
| | | 9 | වීරකැටිය | 1,228,378.63 | 100% |
| | | | පරිපාලන වියදම් ගෙවීම් | 49,406.80 | |
| 4 | මහනුවර | 10 | අඹන්වල | 777,266.00 | 100% |
| | | 11 | ගිරාගම | 718,443.50 | 100% |
| | | 12 | මුල්ගම | 693,488.01 | 100% |
| 5 | හලාවත | 13 | හාල්දඩුවන | 1,594,761.84 | 100% |
| | | 14 | නවගත්තේගම | 452,600.06 | 27% |
| | | 15 | කුඩාවැව | 674,731.51 | 45% |
| | | | පරිපාලන වියදම් ගෙවීම් | 34,561.80 | |
| 6 | ගම්පහ | 16 | උඩුගම්පොළ | 1,736,406.73 | 100% |
| | | 17 | දොම්පේ | 1,774,699.60 | 100% |
| | | | පරිපාලන වියදම් ගෙවීම් | 22,422.00 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 7 | රත්නපුර | 18 | ඇහැළියගොඩ | 994,249.90 | 100% |
| | | 19 | කුරුවිට | 1,467,281.72 | 100% |
| | | 20 | තිඹොල්කැටිය | 2,149,293.24 | 100% |
| | | | පරිපාලන වියදම් ගෙවීම් | 39,174.00 | |
| 8 | අනුරාධපුර | 21 | තන්තිරිමලේ | 1,040,629.50 | 100% |
| | | 22 | එප්පාවල | 559,593.00 | 100% |
| | | 23 | කපුගොල්ලෑව | 751,083.85 | 100% |
| | | 24 | ඇළයාපත්තුව | 380,000.00 | 100% |
| | | | පරිපාලන වියදම් ගෙවීම් | 83,577.58 | |
| 9 | කෑගල්ල | 25 | අඹේපුස්ස | 1,063,517.92 | 100% |
| | | 26 | පින්නවල | 1,984,558.53 | 100% |
| | | | පරිපාලන වියදම් ගෙවීම් | 40,730.35 | |
| 10 | මාතලේ | 27 | කීඹීස්ස | 2,468,881.52 | 100% |
| | | 28 | දේවහුව | 2,327,504.61 | 100% |
| | | 29 | හඳුන්ගමුව | 792,341.58 | 25-49% |
| | | | පරිපාලන වියදම් ගෙවීම් | 5,403.78 | |
| 11 | අම්පාර | 30 | පානම | 2,278,092.32 | 100% |
| | | | පරිපාලන වියදම් ගෙවීම් | 23,755.20 | |
| 12 | මාතර | 31 | බෙරළපනාතර | 910,321.32 | 100% |
| | | | පරිපාලන වියදම් ගෙවීම් | 21,651.49 | |
| 13 | නුවරඑළිය | 32 | මතුරට | 852,252.36 | 100% |
| | | | පරිපාලන වියදම් ගෙවීම් | 9,999.64 | |
| | **එකතුව** | | | **42,453,526.50** | |

## 4.3 පොහොර ගබඩා ඉදිකිරිම - 2010 අවිච්ඡේද කර්මාන්ත

වැය ශීර්ෂය - 281/2/2/8/2104 2011/12/31 දිනට ප්‍රගතිය

| | දිස්ත්‍රික්කය | පොහොර ගබඩාවේ නම | වෙන්කළ ප්‍රතිපාදන (2011) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1 | යාපනය | කයිතඩි | 2,172,296.52 | 100% |
| 2 | කුරුණෑගල | අලව්ව | 1,046,172.81 | 100% |
| 3 | මඩකලපුව | වෙල්ලාවේලි | 1,513,404.87 | 100% |
| 4 | ගම්පහ | බඩල්ගම | 954,562.01 | 100% |
| 5 | හම්බන්තොට | මොදරවාන | 192,754.35 | |
| | | බෙරලිහෙල | 193,052.70 | |
| | | මිගහජඳුර | 179,633.21 | |
| 6 | අනුරාධපුර | ඇතාකඩ | 183,991.71 | |
| | **එකතුව** | | **6,435,868.18** | |

# 5.ආයතනික සංවර්ධන අංශය.

## 5.1 හැඳින්වීම

ගොවිජන සේවා මධ්‍යස්ථාන 555 ක ක්‍රියාකාරකම් අධීක්ෂණය කරමින් මෙහෙයවීම සහ ඒ හරහා ගොවි ජනතාවට අවශ්‍ය සේවා පහසුකම් සැලසීම හා ඒ සඳහා මැදිහත්වීම සිය මෙහෙවර කොට ඇති ආයතනික සංවර්ධන අංශය 2011 වර්ෂය තුළ ඉටුකරන ලද කාර්යභාරය ඒ ඒ විෂයන් ඔස්සේ පහත සඳහන් පරිදි පෙළ ගැස්වේ.

## 5.2 මධ්‍යස්ථාන අධීක්ෂණය.

5.2.1 පරීක්ෂණ වාර්තා.

වර්ෂය තුළ මධ්‍යස්ථාන පරීක්ෂණ වාර්තා 294 ක් ඉදිරිපත්වී ඇත. ගම්පහ, මාතලේ, මහනුවර, ගාල්ල, බදුල්ල, යාපනය, අනුරාධපුරය යන දිස්ත්‍රික්ක වලින් පරීක්ෂණ වාර්තා වැඩි ප්‍රමාණයක් ලැබී ඇති අතර කොළඹ, නුවරඑළිය, පුත්තලම, ත්‍රිකුණාමලය, මඩකලපුව, කිලිනොච්චි යන දිස්ත්‍රික්ක වලින් වාර්තා ඉදිරිපත් කර නැත. ලැබී ඇති වාර්තා සම්බන්ධයෙන් අඩුපාඩු යථාවත් කිරීම සඳහා දිස්ත්‍රික්ක වලට උපදෙස් ලබාදී ඇති අතර වර්ෂය තුළ පවත්වන ලද සියළුම නියෝජ්‍ය / සහකාර කොමසාරිස් රැස්වීම් වලදී අඩුපාඩු සම්බන්ධයෙන් හා වාර්තා ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම් කර ඇත.

5.2.2 වාර්ෂික ගිණුම් වාර්තා.

2008, 2009 හා 2010 වර්ෂ සඳහා පිළිවෙලින් 412, 375, 295 වශයෙන් වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත්කර ඇත. අග කාර්තුව තුල වාර්තා හිඟ හිටීම සම්බන්ධයෙන් දිස්ත්‍රික්ක විශේෂයෙන් දැනුවත් කර ඇත. මෙම වර්ෂය තුළද මෙම විෂය සඳහා ගණකාධිකාරීවරයෙකුගේ සේවය නොලැබීම නිසා ඉදිරි කටයුතු සිදුවී නැත.

5.2.3 කම්ටු සාමාජික දීමනා.

කම්ටු සාමාජික දීමනා වශයෙන් වාර්ෂික ප්‍රතිපාදන යටතේ රු.මි. 04 ක් වෙන්කර ඇති අතර දිස්ත්‍රික්ක වල ඉල්ලීම් අනුව රු. 2,760,000.00 ක මුදල් ප්‍රතිපාදන වෙන්කර දී ඇත.

## 5.3 පොහොර වැඩසටහන්

### 5.3.1 "කෙතට අරුණ" පොහොර සහනාධාර වැඩසටහන.

පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී 2011 වර්ෂය තුළ 2010/2011 මහ කන්නය, 2011 යල කන්නය හා 2011/2012 මහ කන්නය යන කන්න තුනම අන්තර්ගත වේ. ඒ අනුව මෙම කන්න තුන තුළම පොහොර නිකුත් කිරීම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| කන්නය | පොහොර ලබාගත් ගොවීන් සංඛ්‍යාව | කුඹුරු අක්කර ප්‍රමාණය | නිකුත් කරණ ලද පොහොර ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | | | |
|---|---|---|---|---|---|---|
| | | | යූරියා | T.S.P | M.O.P | එකතුව |
| 2010/2011 මහ | 1,114,961 | 1,841,018.58 | 175,099.91 | 58,149.12 | 51,484.06 | 284,733.10 |
| 2011 යල | 762,908 | 1,165,998.81 | 110,835.18 | 36,890.25 | 33,204.07 | 180,929.50 |
| 2011/2012 ඉ | 1,049,546 | 2,201,052.81 | 163,143.64 | 52,614.61 | 47,958.66 | 263,716.91 |

ඉ

ඉහත තොරතුරු අනුව 2010 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂයේ වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණයේ ප්‍රගතියක් නිරීක්ෂණය වේ. භෞතික හා මානව සම්පත් ඉතා සීමිත වීම නිසා පෙර වර්ෂ වල මෙන්ම පොහොර බෙදාහැරීමේ ගැටළු පවතී.

* පොහොර සහනාධාර වැඩසටහන යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලබාදුන් රු.මි. 400 ක අත්තිකාරම් මුදලින් 2011 වර්ෂය තුළ රු. 40,630,894.75 ක මුදලක් නැවත පියවා ඇත.

* 2011 නව පොහොර සහනාධාර වැඩසටහන වෙනුවෙන් ගොවි ජනතාව දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයට ගොවි ජනතාව සහභාගි කරවීම වෙනුවෙන් ප්‍රවාහන වියදම් රු.426,937.00ක මුදලක් ගොවීන්ගේ භාරකාර අරමුදලින් දරා ඇත.

## 5.3.2 කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරි ගැන්වීමේ වැඩසටහන.

කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් මෙහෙයවන වැඩසටහන එම අමාත්‍යාංශය විසින් ලබාදෙන ලද රු.මි. 90.38 ක මුදල් ප්‍රතිපාදන යොදවමින් කාබනික පොහොර ගම්මාන ස්තාපිත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

ගොවිජන සේවා වසම් තුළ කාබනික පොහොර ආදර්ශන ස්ථාපිත කිරීම සඳහා උපකරණ කට්ටල 41,150 ක්ද, පොහොර ඇසුරුම් නිෂ්පාදනය කිරීම සඳහා මැෂින් 120 ක්ද, දිස්ත්‍රික්ක හරහා බෙදා දෙන ලදී. ගොවිජන සේවා මධ්‍යස්ථාන හා වසම් මට්ටමින් පොහොර ආදර්ශන පිහිටුවීම, නිලධාරීන් හා ගොවීන් පුහුණු කිරීම යන ක්‍රියාකාරකම් ඉලක්ක ඔස්සේ සිදුකර ඇත. වසම් හා මධ්‍යස්ථාන සඳහා නිෂ්පාදන ඉලක්ක ලබාදී තිබූ අතර මධ්‍යස්ථාන මට්ටමින් එම ඉලක්ක සපුරා ඇත. එය පහත වගුව මගින් දැක්වේ.

| අනු අංකය | විස්තරය | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ඉලක්කය රු.මි. | මූල්‍ය ප්‍රගතිය රු.මි. |
|---|---|---|---|---|---|
| 1 | උපකරන කට්ටල බෙදාදීම. | 41,150 | 41,150 | 79.262 | 78.681 |
| 2 | ඇසුරුම් උපකරණ බෙදාදීම. (බෑග් මහන මැෂින්) | 120 | 120 | 2 | 1.98 |
| 3 | ගොවිජන සේවා මධ්‍යස්ථාන වල ආදර්ශන පිහිටුවීම. | 500 | 604 | 3.9 | 3.6366 |
| 4 | පුහුණුව නිලධාරීන්<br>ගොවීන් | 11,140<br>55,700 | 1,748<br>24,393 | 4.35 | 3.4920 |
| 5 | පරිපාලන වියදම් | | | 0.87 | 0.9009 |
| | එකතුව | | | 90.3820 | 88.6905 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6 | ගොවිජන සේවා මධ්‍යස්ථාන වල ස්ථාපිත ආදර්ශන වල කාබනික පොහොර නිෂ්පාදනය (මෙ.ටො.) | 2,000 | 4,634.1 | | |
| 7 | වසම් වල පිහිටුවා ඇති කාබනික පොහොර ආදර්ශන වල නිෂ්පාදනය (මෙ.ටො.) | 164,600 | 57,201 | | |

## 5.4 ගොවිජන සේවා කමිටු සඳහා බීජ, රෝපන ද්‍රව්‍ය හා කෘෂි යෙදවුම් සැපයීමේ ක්‍රියාවලිය සම්බන්ධීකරණය හා අධීක්ෂණය.

ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ගොවි ජනතාවට අවශ්‍ය බීජ හා රෝපණ ද්‍රව්‍ය, පැළ වර්ග, කෘෂි උපකරණ හා වෙනත් අවශ්‍ය කෘෂිකාර්මික ද්‍රව්‍ය සපයා දී ඇත. ඒ පිළිබඳ තොරතුරු වගුවේ දැක්වේ.

| දිස්ත්‍රික්කය | බීජ හා රෝපණ ද්‍රව්‍ය අළෙවිය | | | කෘෂි උපකරණ අළෙවි වටිනාකම රු. | නිෂ්පාදන අළෙවි වටිනාකම රු. | වෙනත් අළෙවි කටයුතු වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|
| | බිත්තර වී සැපයුම (බුසල්) | එළවළු හා වෙනත් බීජ වටිනාකම රු. | පැළ වර්ග වටිනාකම රු. | | | |
| ගම්පහ | 18,975.00 | 5,131,663.00 | 10,083,826.00 | 2,875,466.00 | 297,205.00 | 6,030,432.00 |
| කළුතර | 32,382.00 | 2,893,684.00 | 2,078,065.00 | 387,648.00 | 252,507.00 | 439,407.00 |
| මහනුවර | 1,978.00 | 2,305,938.00 | 435,086.00 | 2,540,861.00 | 108,959.00 | 91,425.00 |
| මාතලේ | 4,229.00 | 1,637,392.00 | 313,761.00 | 2,013,315.00 | 388,671.00 | 2,148,638.00 |
| නුවරඑළිය | 1,853.00 | 2,342,740.75 | 47,584.25 | 3,683,938.00 | - | 1,414,376.00 |
| ගාල්ල | 10,289.00 | 3,459,014.00 | 2,751,331.00 | 952,623.00 | 267,234.00 | 903,496.00 |
| මාතර | 2,379.67 | 1,120,759.50 | 580,043.00 | 466,055.00 | | 112,350.50 |
| හම්බන්තොට | 1,500.00 | 237,498.76 | 43,555.00 | 35,764.00 | - | 6,415.50 |
| කුරුණෑගල | 7,727.00 | 4,642,361.00 | 1,006,786.00 | 2,271,799.00 | 181,977.50 | 1,971,466.00 |
| පුත්තලම | 5,771.00 | 3,323,300.00 | 3,208,490.00 | 2,995,723.00 | 30.00 | 64,502.00 |
| අනුරාධපුර | 6,984.00 | 114,529.00 | 128,091.00 | 90,591.00 | 345.00 | 1,240.00 |
| පොළොන්නරුව | 1,758.00 | 252,214.00 | 45,225.00 | 398,660.00 | 92,171.50 | 127,289.00 |
| බදුල්ල | 1,460.00 | 6,641,149.00 | 227,471.00 | 10,847,651.00 | 1,442,388.00 | 2,955,210.73 |
| මොණරාගල | 109,416.00 | 852,470.00 | 770,180.48 | 713,925.00 | - | 104,010.00 |
| රත්නපුර | 657,285.00 | 1,313,858.00 | 583,890.00 | 320,477.00 | 18,170.00 | 222,390.00 |
| අම්පාර | 49,604.00 | 772,838.00 | 12,200.00 | 152,974.00 | - | 8,100.00 |
| ත්‍රිකුණාමලය | 6,455.00 | 40,960.00 | 35,800.00 | - | 0 | 127,496.00 |
| **එකතුව** | **920,045.67** | **37,082,369.01** | **22,351,384.73** | **307,474,700.00** | **3,049,658.00** | **16,728,243.73** |

## 5.5 ජපන් යෙන් ආධාර වැඩසටහන යටතේ ට්‍රැක්ටර් බෙදාහැරීම හා කළමනාකරණය

මෙම වර්ෂය තුළ ට්‍රැක්ටර් බෙදාහැරීමක් සිදුවී නැත.

පසුගිය වර්ෂවල හිඟ වාරිකද සමග රෝද 2, රෝද 04 ට්‍රැක්ටර් සහ වතුර පොම්ප සඳහා 2011 වර්ෂය තුළ අයවී ඇති සම්පූර්ණ මුදල රු.54,710,001/- ක් වේ.

## 5.6 නෙත් කලාපීය ප්‍රදේශ වල පුරන් කුඹුරු අස්වැද්දීමේ ජාතික වැඩසටහන.

දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ රු.මි.220ක මුදල් ප්‍රතිපාදන මෙම වැඩසටහන සඳහා 2011 වර්ෂය වෙනුවෙන් වෙන්කර දී ඇත. එම ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික්ක 25 තුළ තෝරාගත් වැව් සහ සුළු වාරිමාර්ග පිළිබඳ කර්මාන්ත 335ක් ආරම්භ කර සම්පූර්ණ කරන ලද අතර එමගින්, ජල පහසුකම් නොමැතිවීම හේතුවෙන් පුරන්ව තිබූ කුඹුරු අක්කර 13,087.75ක් නැවත අස්වැද්දීමට අවශ්‍ය යටිතල පහසුකම් සලසා ඇත. ඒ ඒ දිස්ත්‍රික් මට්ටමින් වෙන්කරදෙන ලද ප්‍රතිපාදන ඇමුණුම 1 සහ 2 යටතේ දක්වා ඇත.

## 5.7 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශන කටයුතු.

දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය 2011 වර්ෂයේ මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තලදී පවත්වන ලදී. මෙම ජාතික ප්‍රදර්ශනය සඳහා මූලිකව මොණරාගල දිස්ත්‍රික් කාර්යාලයද ඊට අමතර වශයෙන් රත්නපුර හා ගාල්ල දිස්ත්‍රික් කාර්යාලද මෙහෙයවීම හා මැදිහත්වීම ඉටුකරන ලදී. ගොවිජන සංවර්ධන අරමුදලෙන් අවශ්‍ය අත්තිකාරම් ලබාදී ඇත.

මොණරාගල - රු. 650,343.79
රත්නපුර - රු. 150,000.00
ගාල්ල - රු. 63,956.60

## 5.8 වප්මඟුල් උත්සව / ගොවි සතිය.

### 5.8.1 ජාතික වප්මඟුල් සතිය ක්‍රියාත්මක කිරීම.

ගොවිජන සේවා හා වනජීවී ගරු අමාත්‍යතුමාගේ තීරණයක් මත 2011 වර්ෂයේ නොවැම්බර් 03 සිට 10 දක්වා දිස්ත්‍රික් මට්ටමින් වප්මඟුල් සතියක් සංවිධානය කරන ලද අතර ඊට අදාළ සියළු වැය බර ගොවීන්ගේ භාරකාර අරමුදලින් දරා ඇත. ඒ අනුව පුවත්පත් දැන්වීම් සඳහා දරණ ලද වියදම පහත පරිදි වේ.

ලක්බිම පුවත්පත - රු. 101,606.40
ලංකාදීප පුවත්පත - රු. 308,000.00
දිවයින පුවත්පත - රු. 116,121.60
දිනමිණ පුවත්පත - රු. 207,200.00

ඊට අමතරව ඉල්ලීම් ඉදිරිපත් කර ඇති දිස්ත්‍රික් 07 ක වියදම් ප්‍රතිපූර්ණය කර ඇත.

### 5.8.2 ගොවි සතිය.

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන ගොවි සතිය වැඩසටහන වව්නියාව දිස්ත්‍රික්කයේ තාන්ඩිකුලම් බීජ ගොවිපලේදී 2011 අගෝස්තු 01 – 05 සතිය තුළ පවත්වන ලද අතර එයට සමගාමීව කෘෂිකාර්මික ප්‍රදර්ශනයක්ද සංවිධානය කර තිබිණ. වව්නියාව දිස්ත්‍රික්කය මෙහෙයවීමෙන් දෙපාර්තමේන්තු ප්‍රදර්ශන කුටිය ඉදිකර පවත්වාගැනීමට මැදිහත්ව කටයුතු කරන ලදී.

## 5.9 ගෘහස්ථ ආර්ථික ඒකක දස ලක්ෂයක් ස්ථාපිත කිරීමේ වැඩසටහන, දිවිනැගුම

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2011 අනුව ගෘහ ඒකක සංවර්ධනය කිරීම සඳහා ආරම්භ කරන ලද වැඩසටහනට මැදිහත්ව අවශ්‍ය කටයුතු කිරීම. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් හා ප්‍රතිපාදන මත දිවි නැගුම දීප ව්‍යාප්ත වැඩසටහන යටතේ බීජ කට්ටල බෙදාහැරීම, හරිතාගාර වල පැල තවාන් ස්ථාපිත කිරීම, දිවි නැගුම ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් පැවැත්වීම ආදිය සඳහා දෙපාර්තමේන්තුවේ උපරිම දායකත්වය ලබාදීම.

## 5.10 අක්කරබදු.

2011 වාර්ෂික ඉලක්කය රු. 56,171,187.56 කි. පසුගිය වර්ෂ වල හිඟ මුදල් රු.17,196,950.22 කි. ඒ අනුව සම්පූර්ණ ඉලක්කය රු.73,368,137.78 කි. වර්ෂය තුළ ගොවිජන සංවර්ධන අරමුදලට එවා ඇති දායක මුදල රු. 6,543,184.80 කි. යාපනය, මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක වලින් අක්කර බදු අය නොකෙරේ.

## 5.11 විශේෂ වැඩසටහන්.

ගොවිජන සේවා හා වනජීවි ගරු අමාත්‍යතුමාගේ තීරණ මත 2011 වර්ෂයේ මුල් භාගයේ නියං කාලය තුළ ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා එළවළු පොළ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

සිංහල අවුරුදු උත්සවය වෙනුවෙන් අවුරුදු පොළ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

# 6. ප්‍රවාහන අංශය.

2011 වර්ෂයේ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද සියළුම සංවර්ධන වැඩ, පනතේ නීතිමය කාර්යයන් සහ පරිපාලනය මගින් පැවරෙන විවිධ නිල ප්‍රවාහන කටයුතු සඳහා ප්‍රවාහන අංශයේ විශාල දායකත්වයක් ලබා දෙන ලදී. මේ සඳහා සැහැල්ලු වාහන වන ජීප් රථ, ඩබල් කැබ් සහ මෝටර් රථ, සහ ලොරි, ටෙන් වීල් හා ප්‍රයිම්මූවර් රථ ඇතුලත්ව වාහන 104 පමණ වන දෙපාර්තමේන්තුව සතු වාහන ඇණියක් යොදවා ගන්නා ලද එම වාහන අතර ඉතා පැරණි වාහන ඇති බැවින් නිරන්තරයෙන් පැන නැඟුණු අළුත්වැඩියාවන් හා නඩත්තු කටයුතු ඉටුකර ගනිමින් ඉහත කාර්යයන්ට කිසිදු බාධාවකින් තොරව අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සලසා දී ඇත.

මීට අමතරව ප්‍රධාන කාර්යාලය ඇතුළු සියළු දිස්ත්‍රික් කාර්යාල වල ඇති වාහන වල සියළුම නඩත්තු, අළුත් වැඩියාවන්, ඉන්ධන සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම, ආදායම් බලපත්‍ර ලබා ගැනීම්, අනතුරු පිළිබඳ නීතිමය කටයුතු, ධාවන සටහන් පරීක්ෂා කර විගණනය වෙත ඉදිරිපත් කිරීම, විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම, වාහන රක්ෂණය, වාර්ෂික ඇස්තමේන්තු සැකසීම, ප්‍රවාහන කටයුතු සම්බන්ධ දත්ත රැස් කිරීම හා ඉහල පරිපාලනයට වාර්තා කිරීම, ඉන්ධන ඇණවුම් ලබා දීම සහ බිල්පත් පියවීම, මෙම අංශය මගින් ඉටුකරන කාර්යයන් වේ.

**2011 වර්ෂය සඳහා ප්‍රවාහන අංශය මගින් ඉටු කර ඇති කාර්යයන් සැකෙවින් පහත පරිදි වේ.**

1. නිළධාරි ප්‍රවාහන කටයුතු - කොළඹ දිස්ත්‍රික්කය ඇතුලත සහ දිවයින පුරා
2. දිවි නැඟුම රාජකාරි - බීජ සහ පොහොර ප්‍රවාහනය - දිවයින පුරා
(බීජ කට්ටල් ලක්ෂ 25ක් සති 03ක් වැනි කෙටි කාලයක් තුලදී දෙපාර්තමේන්තු ලොරි රථ 18ක් යොදා ගනිමින් සුරක්ෂිතව දිවයින පුරා බෙදා හැර ඇත)
3. වැව් ප්‍රතිසංස්කරණය සඳහා අධික බරෙන් යුතු සහ විශාල බුල්ඩෝසර් සහ එස්කැවේටර් යන්ත්‍ර දිවයින පුරා ප්‍රවාහනය
4. කාබනික පොහොර ප්‍රවාහනය, කෘෂිභෝග පුරෝකතන වැඩසටහන, අළුත් සහල් මංගල්‍යය, දැයට කිරුළ, වප් මඟුල්, ගොවි බැංකු වැඩසටහන් සඳහා ලොරි රථ, ජීප්, සහ කැබ් රථ යෙදවීම.
5. ගොවිජන සේවා සහ වන ජීවී අමාත්‍යාංශය මගින් පැවරූ ප්‍රවාහන රාජකාරි.
6. චීන රජයෙන් ආනයනය කරන ලද ඩෝසර් යන්ත්‍ර අළුතින් ස්ථාපිත කරන ලද අංගන වෙත ප්‍රවාහනයට
7. යෙන් ආධාර යටතේ ලැබුණු ට්‍රැක්ටර් රථ හා කෘෂි උපකරණ දිවයින පුරා ප්‍රවාහනය
8. අබලි වාහන 13ක් අපහරණය කිරීම සහ ටොයොටා කැබ් රථ 03ක් අත්පත් කර ගැනිම

# 7. නීති අංශය.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් වලින් ප්‍රශස්ත ඵලදායිතාවක් ලබා ගනිමින් ශ්‍රී ලාංකීය ගොවි ජනතාව තිරසාර සංවර්ධනයක් සඳහා රැගෙන යාමේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දර්ශනය මුදුන්පත් කරලීම සඳහා පහත සඳහන් ආකාරයෙන් නීති අංශය එම මෙහෙවරට දායක වේ.

1. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සැකසීමට ගොවිජන නීතිය, ඊට අදාල රීති සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු අමාත්‍යාංශය වෙත ලබා දීම හා සහාය වීම.

2. අඳ ගොවීන් හා ඉඩම් හිමියන් අතර ඇති වන කෘෂිකාර්මික ආරවුල් විසදීම සඳහා වන නෛතික මගපෙන්වීම.

3. වගා අයිතිවාසිකම් ආරක්ෂා කර දීම.

4. ග්‍රාමීය වාරි කර්මාන්ත ආරක්ෂා කිරීම හා වගා රීති ක්‍රියාත්මක කිරීමට අදාල නීතිමය රැකවරණය සැලසීම.

5. දෙපාර්තමේන්තු නිලධාරින් හා ගොවීන් ආයතන සඳහා නීතිමය උපදේශනය

6. ගොවිජන නීතිය බලගැන්වීම සඳහා අධිකරණමය කාර්යයන්හි නිරත වීම.

## 7.1 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත.

2000 අංක 46 දරණ පනතට 2011 අංක 46 දරණ සංශෝධිත පනත ගෙන ආ අතර එය 2011.11.22 දින සිට ක්‍රියාත්මක වන බැවින් ඒ අනුව අඳ ගොවි අනුප්‍රාප්තිය සඳහා ප්‍රතිපාදන සලසා ඇත. එමඟින් 2010.08.18 දින හෝ ඊට පෙර දිනවල ලිඛිත හෝ වාචික ගිවිසුමක් මත අඳ ගොවි අයිතිවාසිකම් හිමි අයකු මිය ගිය අවස්ථාවකදී අඳ අයිතිය උරුම විය යුතු බව සහ අඳ ගොවියා පූර්ණ දුබලතාවයකට පත් වූ විට අඳ ගොවි අනුප්‍රාප්තිය පැවරීම සඳහාද ප්‍රතිපාදන සලසා ඇත.

දැනට ක්‍රියාත්මක වන 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත හා 2011 අංක 46 දරණ(සංශෝධන) පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නියෝග සාදා නීති කෙටුම්පත් සම්පාදකගේ අනුමැතියට යවා ඇති අතර කාලීනව ඉතාමත් වැදගත් වන කෘෂිකාර්මික ඉඩම් කාර්යක්ෂමව වගා කිරීම සඳහා වන පනතේ 22,23, 25 සහ 26 වගන්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නියෝග සදා දැනටමත් වගා නොකර පුරන්ව පැවති කුඹුරු ඉඩම් විශාල ප්‍රමාණයක් වගා කෙරෙමින් පවතී.

## 7.2 ගොවි ආරවුල් විසඳීම. (ගොවිජන විනිශ්චය සභා)

ඉඩම් හිමියන් විසින් අඳ ගොවීන් නෙරපීම, අඳ ගොවීන් විසින් ඉඩම් හිමියන් වෙත ප්‍රවේනි ගෙවීම පැහැර හැරීම ඇතුලු ගොවිජන සංවර්ධන පනත යටතේ සඳහන් වගන්ති 10 ක් පමණ ගොවිජන විනිශ්චය සභාව මගින් පරීක්ෂණ පැවැත්විය යුතු ලෙස දක්වා ඇති අතර 2011 අංක 46 දරණ (සංශෝධිත) ගොවිජන සංවර්ධන පනතට අනුව ගොවිජන විනිශ්චය සභා වල තීරණයට එරෙහිව අභියාචනා කිරීම සඳහා පිහිටුවා ඇති සමාලෝචන මණ්ඩල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි කෙටුම්පත් කර නීති කෙටුම්පත් සම්පාදක වෙත මේ වනවිට ඉදිරිපත්කර ඇත.

ගොවිජන විනිශ්චය සභා පිහිටුවීම ප්‍රමාදවීම හේතුවෙන් ගොවිජන විනිශ්චය සභාව වෙත යොමුකිරීමට තබා ඇති ඉල්ලීම් සංඛ්‍යාව 2011 වර්ෂය දක්වා පහත සඳහන් ආකාරයෙන් වර්ධනය වී ඇත.

| **වර්ෂය** | **ඉල්ලීම් සංඛ්‍යාව** |
|---|---|
| 2004 | 660 |
| 2005 | 1151 |
| 2006 | 2327 |
| 2007 | 3422 |
| 2008 | 3510 |
| 2009 | 3945 |
| 2010 | 4285 |
| 2011 | 4583 |

## 7.3 ගොවි පැමිණිලි (පොදු)

ගොවිජන සංවර්ධන පනත යටතේ ලැබී ඇති පැමිණිලි.

| **2011 වර්ෂය තුල ලැබීම්** | **2011.01.01 දිනට ඉතිරි** | **2011 වර්ෂය තුල විසඳීම්** | **2011.12.31 දිනට ඉතිරි** |
|---|---|---|---|
| 10868 | 2122 | 9340 | 3650 |

## 7.4 අධිකරණ කටයුතු වලට මැදිහත් වීම්.

නීතිපති සහාය ලබා ගැනීමට කටයුතු කිරීම

ශ්‍රේෂ්ඨාධිකරණය - **--**
අභියාචනාධිකරණය - **07**
මහාධිකරණය - **26**
දිසා අධිකරණය - **06**
මහේස්ත්‍රාත් අධිකරණය - **11**

කුඹුරු ඉඩම් අනවසරයෙන් ගොඩ කිරීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටමෙන් නීතිමය පියවර ගැනීම 2011 වර්ෂය තුල ප්‍රගතිය පහත දැක් වේ.

1. අනවසර ගොඩ කිරීම් /ඉදි කිරීම් සඳහා තහනම් නියෝග ලබා ගත් සංඛ්‍යාව (33 වගන්තිය) - **150**
2. වරදට අඩුවම් කිරීම හා යථා තත්ත්වයට පත් කිරීම - (32 වගන්තිය) – **134**

## 7.5 කෘෂිකාර්මික ඉඩම් ලේඛණ සම්බන්ධ කාර්යයන්:

